රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:6/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990 ජනවාරි මස 25 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් බඳ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් හා
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත.

## පළාත් සභාවලට කාර්ය මණ්ඩලය මුදාහැරීම.

89.11.15 වැනි දින අංක:66/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවයි. පළාත් සභාවලට පවරනු ලබන කාර්යයන් හා සම්බන්ධ සියළුම කාර්ය මණ්ඩලයද සමග එම කාර්යයන් පළාත් සභාවලට පැවරීම රජයේ ප්‍රතිපත්තිය බව පළාත් සභාවලට බලතල හා කාර්යයන් පැවරීමෙන් අනතුරුව රජයේ සේවකයන් පළාත් සභාවලට මාරුකිරීම සම්බන්ධයෙන් රජය තීරණය කර ඇති බව ඔබ වෙත දන්වනු කැමැත්තෙමි. එසෙකුදු වුවත් පළාත් සභා සේවයට බැඳීමේ හො යලිත් සිටි සේවාවලම රැඳීසිටීමේ හෝ මනාපය අනුව ක්‍රියා කිරීමට මේ තීරණය කරන ඇති නිලධාරීන්ට ඉඩදිය යුතුය. පළාත් සභාවල සේවය සඳහා මනාපය පළ නොකිරීමෙන් රජයේ ආයතනවල සිටින කාර්ය මණ්ඩලය අතිරික්ත වුවහොත් එම තත්ත්වය ගැන පසුව තීරණයකට එළඹිය හැකිය.

02 කරුණු මෙසේ හෙයින් පළාත් රාජ්‍ය සේවයට බැඳීමට ඒ ඒ නිලධාරීන් දක්වන කැමැත්තට යටත්ව, පවරන ලද කාර්යයන් හා සම්බන්ධව සිටින සියළුම කාර්ය මණ්ඩලය ද පළාත් සභා විසින් භාරගනු ලැබීම අවශ්‍ය වන්නේය. පළාත්බද රාජ්‍ය සේවාවලට සේවක සංඛ්‍යාව නියම කිරීම සම්බන්ධයෙන් කමිටුව හා සේවක සංඛ්‍යා කමිටුව කරන නිර්දේශ ඉහත සඳහන් රජයේ ප්‍රතිපත්තියට යටත්ව ක්‍රියාත්මක කෙරෙනු අංත. (පළාත් සභාවලට පවරනු ලැබූ කාර්යයන් හා ඊනට සම්බන්ධ වන රජයේ සේවකයන් පළාත් සභා සේවයට බැඳීමට මනාපය පළ කිරීමට හෝ පළ නොකිරීමට අනතුරුව) අනුමත සේවක සංඛ්‍යා මට්ටම්වල වැඩිපුර සිටින කාර්ය මණ්ඩලය අනුමත සේවක සංඛ්‍යාවල පවත්නා ඌණතාවන් පසුව නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාර සපුරා ගැනීමට උචිත පරිදි සේවයේ යොදවනවා ඇත.

03 දීප ව්‍යාප්ත සේවා යටතේ ඇති ශ්‍රී ලංකා සත්වපාලන සේවය යන්න සඳහා වන නිවැරදි නාමය ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය යන්න බව සැලකුව මැනවි.

අ/ක:(පී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

(එම්.එන්. ජුනයිඩ්)
රාජ්‍ය පරිපාලන රාජ්‍ය ලේකම්.

පිටපත්:- 01.